# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන

7 වන කාණ්ඩය

ජනවාරි 2021




01 සෞඛ්‍ය රෙගුලාසි පූර්ණ වශයෙන් ආරක්ෂා කරගනිමින් පාර්ලිමේන්තුවේ කටයුතු අඛණ්ඩව

02 පනත් කෙටුම්පත් 08 කට කථානායකවරයා සිය සහතිකය සටහන් කරයි

03 වගකීමට කැපවෙන පාර්ලිමේන්තුවේ පරිපාලන දෙපාර්තමේන්තුව

06 අමාත්‍ය මණ්ඩල තීරණ සම්බන්ධ තම මතය ඉදිරිපත් කිරීමට රාජ්‍ය නිලධාරීන්ට පවතින හැකියාව පිළිබඳව ගිණුම් කාරක සභාවේදී සාකච්ඡා

07 2020 වර්ෂය තුළ ව්‍යවස්ථාදායකයේ සිදුවීම් පිළිබඳ පසු විපරමක්

13 විදෙස්ගත ශ්‍රමිකයන් මෙරටට ගෙන්වා ගැනීමට විදේශ සේවා නියුක්ති කාර්යංශය සතු අරමුදල් යොදා ගන්න - කෝප් කමිටුව



සන්නිවේදන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව



# සෞඛ්‍ය රෙගුලාසි පූර්ණ වශයෙන් ආරක්ෂා කරගනිමින් පාර්ලිමේන්තු කටයුතු අඛණ්ඩව

> "පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දුරස්ථභාවය තබාගැනීම, පාර්ලිමේන්තු සංකීර්ණය තුළ සැමවිටම මුහුණු ආවරණ පැළඳීම, දෑත් පිරිසිදු කර ගැනීම වැනි සෞඛ්‍ය උපදේශන නිසියාකාරයෙන් අනුගමනය කළ යුතු බව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා දන්වා තිබේ."

කොවිඩ් 19 අභියෝගයට මුහුණ දීමට සෞඛ්‍ය අංශ විසින් හඳුන්වා දී ඇති සෞඛ්‍ය රෙගුලාසි පූර්ණ වශයෙන් ආරක්ෂා කර ගනිමින් පාර්ලිමේන්තු කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව තීරණය කළ බව පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක මහතා පවසයි.


මේ අනුව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දුරස්ථභාවය තබාගැනීම, පාර්ලිමේන්තු සංකීර්ණය තුළ සැමවිටම මුහුණු ආවරණ පැළඳීම, දෑත් පිරිසිදු කර ගැනීම වැනි සෞඛ්‍ය උපදේශන නිසියාකාරයෙන් අනුගමනය කළ යුතු බව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා දන්වා තිබේ.

මෙම රෙගුලාසි අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතු බවට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට ලිඛිතව දන්වා ඇති බවත් ඔවුන් වෙත සෞඛ්‍ය මාර්ගෝපදේශන ඇතුළත් පොත් පිංචක් ලබාදී ඇති බවත් දසනායක මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

මේ අතර කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට සෞඛ්‍ය අමාත්‍යංශයට සම්බන්ධ වෛද්‍යවරුන් කැඳවා ඔවුන්ගේ උපදෙස් ලබාගැනීමද සිදු කෙරිණි. එහිදී ඔවුන්ගේ උපදේශය වී ඇත්තේ ලද පී.සී.ආර්. (P.C.R.) පරීක්ෂණ ප්‍රතිඵල අනුව පැහැදිලි වන්නේ අනතුරුදායක වාතාවරණයක් පාර්ලිමේන්තුව තුළ නොමැති බවත්, එබැවින් සෞඛ්‍ය රෙගුලාසි අනුගමනය කරමින් පාර්ලිමේන්තු කටයුතු පවත්වාගෙන යා හැකි බවත්ය.

මේ අතර පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය, ආරක්ෂක නිලධාරීන් හා අනුබද්ධ කාර්යමණ්ඩල සාමාජිකයන් 1400 කට වැඩි සංඛ්‍යාවක් මේ වන විට පී.සී.ආර්. පරීක්ෂණ සඳහා මුහුණ දී ඇති අතර අවස්ථා තුනකදී පාර්ලිමේන්තුව තුළ එම පරීක්ෂණ පැවැත්වීමද විශේෂත්වයකි.

# පනත් කෙටුම්පත් 08කට කථානායකවරයා සිය සහතිකය සටහන් කරයි






**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව අනුව පනත් කෙටුම්පත් 08 ක් සඳහා 2021 ජනවාරි 18 වන දින තම සහතිකය සටහන් කළ බව ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී නිවේදනය කළේය.**

ඒ අනුව කම්කරු අමාත්‍යවරයා ඉදිරිපත් කළ සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) සංශෝධන පනත, ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයි සේවයෙහි යෙදවීමෙහි සංශෝධන පනත, අවම වේතන (ඉන්දියානු කම්කරු) සංශෝධන පනත, කර්මාන්තශාලා සංශෝධන පනත මේ අතර වේ.

තවද අධිකරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ දණ්ඩනීති සංග්‍රහ සංශෝධන පනත, සාක්ෂි සංශෝධන පනත, ඇප සංශෝධන පනත මෙන්ම වෙළඳ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ බුද්ධිමය දේපළ සංශෝධන පනත සඳහා කථානායකවරයා මෙලෙස සිය සහතිකය සටහන් කර ඇත.

ඒ අනුව ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයි සේවයෙහි යෙදවීමෙහි සංශෝධන පනත මඟින් පුහුණුවීමේ නැව්වල සේවයේ යෙදවීමේ කලින් පැවති අවු 15ක්වූ අවම වයස අවු.16ක් දක්වා වැඩිකර ඇත. තවද මෙම සංශෝධනය මඟින් ළමයා සහ තරුණ අය යන අර්ථ නිරූපණයට අනුව වයස අවු.16 ට අඩු අය ළමයින් ලෙස හැඳින්වෙන අතර අවු 14ත් 18ත් අතර අය තරුණ අය ලෙස හැඳින්වීම ඇතුළු සංශෝධන කිහිපයක් සිදුකොට ඇත.

අවම වේතන (ඉන්දියානු කම්කරු) සංශෝධන පනත මඟින් වතුවල ළමයින් සේවයේ යෙදවීමේ අවම වයස අවු 16 දක්වා වැඩිකිරීම, ගැහැණු කම්කරුවන් වෙනුවෙන් අවම වේතන අනුපාතිකයක් ගෙවීමේ වයස් සීමාව අවු 15 වෙනුවට අවු 16ක් බවට පත්කර තිබේ. සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබද (සේවය සහ වේතන විධිමත් කිරීමේ) සංශෝධන පනත මඟින් සේවය කිරීමේ අවම වයස අවු 14 සිට අවු 16 දක්වා වැඩි කිරීම සිදුවී ඇත. තවද 1942 අංක 45 දරන කර්මාන්තශාලා පනත සංශෝධනය මඟින් තරුණ තැනැත්තන්ගේ සේවා නියුක්ති කාලය එක් දිනකදී පැය 12 නොඉක්මවිය යුතු අතර එය පෙ.ව 6.00ට පෙර ආරම්භ නොවිය යුතු බවත් ප.ව 1.00 වන විට අවසන් විය යුතු බවත් නීතිගත කර තිබේ. මෙහිදී තරුණ තැනැත්තකු යන යෙදුමේ අර්ථ නිරූපණය වයස අවු.16 සිට 18 අතර වයස් කාණ්ඩයට අයත් තැනැත්තන් ලෙස දක්වා ඇත.

මෙම පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමෙන් අනතුරුව ඡන්ද විමසීමකින් තොරව සම්මත විය.

විශේෂාංග

# වගකීමට කැපවෙන පාර්ලිමේන්තුවේ පරිපාලන දෙපාර්තමේන්තුව



**ආයතනයක එදිනෙදා කාර්යයන් පවත්වා ගෙනයාමට මානව සම්පත අත්‍යවශ්‍යම සාධකයකි. පාර්ලිමේන්තුවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට දායකත්වය ලබාදෙන මානව සම්පත සම්බන්ධයෙන් සියලු වගකීම් දරනු ලබන්නේ පරිපාලන දෙපාර්තමේන්තුවයි.**

පාර්ලිමේන්තුවේ පරිපාලන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සුසන්ත වෛද්‍යරත්න මහතා පරිපාලන දෙපාර්තමේන්තුවට පැවරී ඇති වගකීම පිළිබඳව පැහැදිලි කරන්නේ පහත පරිද්දෙනි.

> "පාර්ලිමේන්තුවේ සියලුම සේවකයන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම යාම දක්වා සියලු කාරණා ඉටුකරන්නේ පරිපාලන දෙපාර්තමේන්තුව මඟින් ඒ කියන්නෙ පත්වීම් ලබාදීම, උසස් වීම් ලබාදීම, නිවාඩු ආදිය පරීක්ෂා කිරීම, විශ්‍රාම යාමට අවශ්‍ය ලිපි ලේඛන සැකසීම, සේවකයන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම ආදී සියලු දේවල් ඉටුකරන්නෙ පරිපාලන දෙපාර්තමේන්තුවෙන්".

> "ඇත්තටම රටේ නීති සම්පාදනයේ උත්තරීතර ආයතනය වන පාර්ලිමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව සහ විධිමත්ව පවත්වාගෙන යන්නට ආයතනයේ මානව සම්පත විධිමත්ව යොදවන්න අවශ්‍යයි. මේක විශාල වගකීමක්. පරිපාලන දෙපාර්තමේන්තුව විදියට අපි ඒ වගකීම නිවැරදිව ඉටුකරනවා".

විශේෂයෙන් පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන්ට අවශ්‍ය සේවාවන් සැපයීමද පරිපාලන දෙපාර්තමේන්තුවට පැවරෙන වගකීමකි.

මෙම සියලු කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා පාර්ලිමේන්තුව තුළ පරිපාලන දෙපාර්තමේන්තුවේ අංශ හයක් පවතියි. ආයතන කාර්යාංශය, මන්ත්‍රී සේවා කාර්යාංශය, ප්‍රවාහන කාර්යාංශය, ලේඛන සැකසුම් කාර්යාංශය, මානව සම්පත් සංවර්ධන කාර්යාංශය හා ලේඛනාගාරය එම අංශ හයයි.

ආයතන අංශය මඟින් පුරප්පාඩු සඳහා අවශ්‍ය නිලධාරීන් පත්කරගැනීමට අදාල දැන්වීම් පළ කිරීමේ සිට අවශ්‍ය විභාග, සම්මුඛ පරීක්ෂණ ආදිය පවත්වා එසේ බඳවාගන්නා නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම සිදුකරයි. එසේම නිලධාරීන්ගේ වැටුප් වර්ධක, රක්ෂණ ආවරණ, ණය පහසුකම්



**සුසන්ත වෛද්‍යරත්න මහතා**
අධ්‍යක්ෂ
පරිපාලන දෙපාර්තමේන්තුව







ලබාගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ පාර්ලිමේන්තු කාර්යමණ්ඩල උපදේශන කාරකසභාවේ වාර්තා නිවැරදිව පවත්වාගෙන යාමද සිදු කරයි.

මන්ත්‍රී සේවා කාර්යාලය ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අවශ්‍ය සේවා සැපයීම සම්බන්ධයෙන් කටයුතු කරයි. විශේෂයෙන් කථානායක නිල නිවාසය කළමනාකරණය කිරීම සහ නඩත්තු කටයුතු පවත්වාගෙන යාම, මාදිවෙල පවතින මන්ත්‍රී නිවාස සංකීර්ණයේ නිවාස නිවැරදිව අවශ්‍ය මන්ත්‍රීවරුන්ට ලබාදීම, ඒවායේ අවශ්‍ය නඩත්තු කටයුතු පවත්වාගෙන යාම ආදිය සිදුකරන්නේ මන්ත්‍රී සේවා කාර්යාලය මඟින්ය.

එසේම නුවරඑළිය දිස්ත්‍රික්කයේ පවතින මන්ත්‍රී නිවාඩු නිකේතනය මන්ත්‍රීවරුන්ට වෙන්කර දීම ද, මන්ත්‍රීවරුන්ට එදිනෙදා කටයුතු කිරීමට අවශ්‍ය උපකරණ ලබාදීම ද, මන්ත්‍රී රක්ෂණ ආවරණයට අවශ්‍ය කටයුතු සිදු කිරීම ද, මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික සේවක මණ්ඩලය සම්බන්ධීකරණය කිරීම ද සිදුකරන්නේද මන්ත්‍රී සේවා කාර්යාලය මඟින්ය.

ප්‍රවාහන කාර්යාංශය මඟින් කථානායකවරයාට, නියෝජ්‍ය කථානායකවරයාට, නියෝජ්‍ය කාරකසභා සභාපතිවරයාට අයත් සියලු නිල වාහන ලබාදීම, ඒවායේ සියලු නඩත්තු පහසුකම් සිදුකිරීම, අවශ්‍ය ඉන්ධන ලබාදීම සිදුකරයි. එසේම මහලේකම් මණ්ඩලයට සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට අවශ්‍ය නිල වාහන ලබාදීම සම්බන්ධයෙන් කටයුතු කරන්නේ ප්‍රවාහන කාර්යංශය මඟින්ය.

විශේෂයෙන් සමස්ත කාර්ය මණ්ඩලයට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම සම්බන්ධයෙන් සියලු වගකීම මෙම අංශයට පැවරෙයි. මේ අනුව කොළඹ දිස්ත්‍රික්කය ඇතුළත උදෑසන සේවකයින් සේවයට ගෙන්වීමට සහ රාජකාරිය අවසන්වී නැවත නිවසට යාම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමද ප්‍රවාහන කාර්යාංශය මඟින් ඉටුකරයි.

ඒ ඒ දෙපාර්තමේන්තුවල ඉල්ලීම මත රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට මුද්‍රණ කටයුතු සඳහා නොයවන සියලු ලිපි ලේඛන පොත් වශයෙන් බැඳීම සහ අවශ්‍ය මුද්‍රණ කටයුතු සිදුකිරීම ලේඛන සැකසුම් අංශය මඟින් සිදුකරයි.

එසේම ලේඛනාගාරය මඟින් පාර්ලිමේන්තුවේ සෑම දෙපාර්තමේන්තුවකටම අදාළ ලිපි ගොනු සුරක්ෂිතව ගබඩාකොට තැබීම සිදුවේ.

> “මේ විදියට පරිපාලන දෙපාර්තමේන්තුව මේ අංශ ඔස්සේ වර්තමානයේ පාර්ලිමේන්තු කටයුතු සඳහා සේවය සපයනවා. විශේෂයෙන් අතීතයේ පටන්ම තනි දෙපාර්තමේන්තුවක් විදියට පරිපාලන දෙපාර්තමේන්තුව පැවතිලා තියෙනවා. පසුව තවත් දෙපාර්තමේන්තු කිහිපයක් ඇතිවෙලා තියෙනවා. ඇත්තටම පරිපාලන දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කිරීම හරහා තමයි ඒ ඇතැම් දෙපාර්තමේන්තු ඇතිවෙන්නේ, කෙසේ වෙතත් පරිපාලන දෙපාර්තමේන්තුව සෑම සේවකයෙක් සම්බන්ධයෙන්ම අවශ්‍ය බොහෝ කටයුතු වෙනුවෙන් උපරිමෙන් මැදිහත් වෙනවා”

සුසන්ත වෛද්‍යරත්න මහතා වැඩිදුරටත් අදහස් දක්වමින් එසේ පැවසීය.

*ආසිරි හපුගොඩ*
*මාධ්‍ය නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

# පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගාකිරීමේ මණ්ඩලය සහ පොල් පර්යේෂණ ආයතනය කෝප් කාරක සභාව හමුවට




**පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගාකිරීමේ මණ්ඩලය සහ පොල් පර්යේෂණ ආයතනය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට (කෝප්) කැඳවනු ලැබිණ.**

කාරක සභාවේ සභාපති මහාචාර්ය චරිත හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම කාරක සභා රැස්වීමට අමාත්‍ය මහින්ද අමරවීර, රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන පාඨලී චම්පික රණවක, ඉරාන් වික්‍රමරත්න, ප්‍රේමනාත් සී.දොලවත්ත, එස්. රාසමාණික්කම් යන මහත්වරු ඇතුළු රාජ්‍ය නිලධාරීහු පිරිසක් සහභාගී වූහ.

ඊට අමතරව රාජ්‍ය නිලධාරීහු 40කට ආසන්න පිරිසක් zoom තාක්ෂණය ඔස්සේ මෙම කාරක සභාවට සම්බන්ධවීම විශේෂත්වයක් විය.

මෙම ආයතන 03 හි පවතින තනතුරු පුරප්පාඩු, පොල් කර්මාන්තයට අදාළ සහන ලබාදීම, පොල් ආශ්‍රිත නිෂ්පාදන ලෝක වෙළෙඳ පොළේ ප්‍රවර්ධනය කිරීම, පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාපෘතියක් වන “පාසිකුඩා පොල් උයන”, මීගමුව බීජ ඒකකයට නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම, “වැව්ලි සවිය ශ්‍රමික බලකා ව්‍යාපෘතිය”, පොල් මද ආශ්‍රිත නිෂ්පාදනවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම, පොල් සංවර්ධන අධිකාරිය සිය ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් ස්ටිකර් මුද්‍රණය කිරීම, පොල් ඉඩම් කැබලි කිරීම, “ගස් කපා හෙළීමේ පනත”, වාර්ෂික පොල් එලදාව සම්බන්ධයෙන් වන දත්ත පද්ධතිය, පොල් වගාව ආශ්‍රිත “මයිටා” උවදුර මෙන්ම “කුරුමිණී උවදුර පාලනය” වැනි කරුණු පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. මෙම කාරක සභා රැස්වීම පැය 03කට අධික කාලයක් පැවැත්වුණි.



පුවත්

# අමාත්‍ය මණ්ඩල තීරණ සම්බන්ධ තම මතය ඉදිරිපත් කිරීමට රාජ්‍ය නිලධාරින්ට පවතින හැකියාව පිළිබඳව ගිණුම් කාරක සභාවේදී සාකච්ඡා



**ගැටලු සහගත කාරණා සම්බන්ධයෙන් වන අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ තම මතය ඉදිරිපත් කිරීමට රාජ්‍ය නිලධාරින්ට පවතින හැකියාව පිළිබඳව ප්‍රතිපත්ති තීරණයකට එළඹිය යුතු බවට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව(කෝපා) නිර්දේශයක් ඉදිරිපත් කළේය.**

කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා පෞද්ගලික ගොඩනැගිල්ලක් කුලියට ගැනීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී පසුගියදා සැලකිල්ලට ගත් අතර, එහිදී කාරක සභාවේ සභාපති මහාචාර්ය තිස්ස විතාරණ මහතා විසින් මෙම නිර්දේශය දැනුම් දෙන ලදි.

ප්‍රසම්පාදන සංග්‍රහයට පටහැණිව හා විනිවිදභාවයකින් තොරව රජයේ තක්සේරුකරුගේ තක්සේරුව ඉක්මවායමින් රජයේ අරමුදලින් රු.මිලියන 1524ක් වැයකර කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා පෞද්ගලික ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගැනීමට කටයුතු පිළිබඳව කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවටද කාරක සභාවේදී සාකච්ඡා විය. මෙම සිදුවීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් විමර්ශනයක් සිදු කෙරෙන බව කෘෂිකර්ම අමාත්‍යාංශයේ නව ලේකම් සුමේධ පෙරේරා මහතා එහිදී සඳහන් කළේය.

කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා පෞද්ගලික ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගැනීම පසුගිය රජය සමයේ සිදුවූයේ අමාත්‍ය මණ්ඩලය ගත් තීරණයකට අනුව බව රාජ්‍ය අමාත්‍ය දුමින්ද දිසානායක මහතා කාරක සභාවේදී පවසා සිටියේය.


මේ අවස්ථාවට, අමාත්‍ය උදය ගම්මන්පිල, රාජ්‍ය අමාත්‍යවරුන් වන ලසන්ත අලගියවන්න, වෛද්‍ය සුදර්ශනි ප්‍රනාන්දුපුල්ලේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ඩී. වයි. ජී. රත්නසේකර, වෛද්‍ය උපුල් ගලප්පත්ති, වීරසුමන වීරසිංහ, තිස්ස අත්තනායක, මහාචාර්ය රංජිත් බණ්ඩාර, බුද්ධික පතිරණ, එස්. ශ්‍රී ධරන් යන මහත්ම මහත්මීහු ඇතුළු රාජ්‍ය නිලධාහු පිරිසක් සහභාගි වූහ.



විශේෂාංග

# 2020 වර්ෂය තුළ ව්‍යවස්ථාදායකයේ සිදුවීම් පිළිබඳ පසු විපරමක්





**2020 ජනවාරි මස 03 වැනි සිකුරාදා**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 ව්‍යවස්ථාව ප්‍රකාරව වාරාවසාන කරන ලද 2019 නොවැම්බර් මස 17 වැනි දින අභිනවයෙන් තෝරා පත්කර ගන්නා ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති

අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් පූර්ව භාග 10.00ට අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කර ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන ලදි.

එදිනම -

- පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ටී. රංජිත් ද සොයිසා මහ 2019 දෙසැම්බර් මස 04 වැනි දින අභාවප්‍රාප්ත වීමෙන් ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා ගරු උඩගම ලියනගේ වරුණ ප්‍රියන්ත ලියනගේ මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් පාර්ලිමේන්තුවේ කථානායක ගරු කරූ ජයසූරිය මහතා ඉදිරියේ නිල ප්‍රතිඥාව සිදුකරන කළේය.

- පාර්ලිමේන්තුවේ සභානායක ධූරය සඳහා ගරු දිනේෂ් ගුණවර්ධන මහතාද,

- ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ධූරය සඳහා ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාද, පත්කර ඇති බවත්,

- විරුද්ධ පාර්ශ්වයේ නායක වශයෙන් ගරු සජිත් ප්‍රේමදාස මහතා පාර්ලිමේනතුව විසින් පිළිගන්නා ලද බවත්,

පාර්ලිමේන්තුවේ කථානායක ගරු කරූ ජයසූරිය මහතා විසින් නිවේදනය කරන ලදී.

**2020 ජනවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා**

හිටපු අග්‍රාමාත්‍ය සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු දි.මු.ජයරත්න මහතා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව සම්බන්ධයෙන් කථා පවත්වා අවසන් කරන ලදී.

**2020 ජනවාරි මස 22 වැනි බදාදා**

පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා 2020 ජනවාරි මස 20 වැනි දින සිට සිය මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීම දැනුම් දෙන ලද ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ධම්මික දසනායක මහතා විසින් පාර්ලිමේන්තුව ඉදිරියේ කියවන ලදී.

**2020 ජනවාරි මස 24 වැනි සිකුරාදා**

පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු ටී. රංජිත් ද සොයිසා මහතා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව සම්බන්ධයෙන් කථා පවත්වා අවසන් කරන ලදී.

**2020 පෙබරවාරි මස 05 වැනි බදාදා**

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා සිය පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයෙන් ඉල්ලා අස්වීමෙන් ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා ගරු වැලිගොඩගේ සමන් රත්නප්‍රිය සිල්වා මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් පාර්ලිමේන්තුවේ කථානායක ගරු කරූ ජයසූරිය මහතා ඉදිරියේ නිල ප්‍රතිඥාව ලබා දුන්නේය.

**2020 මාර්තු මස 02 වැනි සඳුදා**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 ව්‍යවස්ථාව ප්‍රකාරව එදින මධ්‍යම රාත්‍රියේ සිට අටවැනි පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී.

**2020 අගෝස්තු මස 05 වැනි බදාදා**
නවවැනි පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයන් තෝරාපත් කර ගැනීම පිණිස මහ මැතිවරණය පවත්වන පැවැත්විණි.

**2020 අගෝස්තු මස 08 වැනි සෙනසුරාදා**
මැතිවරණ කොට්ඨාස 22ක් නියෝජනය කරමින් නවවැනි පාර්ලිමේන්තුවට අභිනවයෙන් තෝරාපත් කර ගන්නා ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් 196 දෙනා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 62 වැනි වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිසම විසින් 2020 අගෝස්තු මස 08 වැනි දිනැති අංක 2187/26 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ පළ කරන ලදී.

**2020 අගෝස්තු මස 10 වැනි සඳුදා**
නවවැනි පාර්ලිමේන්තුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර 29න් තෝරාපත් කර ගන්නා ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් 19 දෙනකුගේ නම් මැතිවරණ කොමිසම විසින් 2020 අගෝස්තු මස 10 වැනි දිනැති අංක 2188/2 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ පළ කරන ලදී.

**2020 අගෝස්තු මස 13 වැනි බ්‍රහස්පතින්දා**
මහ මැතිවරණයෙන් පසු -

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42(4) ව්‍යවස්ථාව ප්‍රකාරව 2020 අගෝස්තු මස 09 දින සිට බලපැවැත්වෙන පරිදි 2020 අගෝස්තු මස 13 වැනි දිනැති අංක 2188/40 අති විශේෂ ගැසට්පත්‍රයේ පළ කරමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යවරයා වශයෙන් ගරු මහින්ද රාජපක්ෂ මහතාද,

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙළින් 43(2) හා 44(1) ව්‍යවස්ථා ප්‍රකාරව 2020 අගෝස්තු මස 12 දින සිට බලපැවැත්වෙන පරිදි 2020 අගෝස්තු මස 13 වැනි දිනැති අංක 2188/42 සහ 2188/43 දරන අති විශේෂ ගැසට්පත්‍රවල පළ කරමින් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ද, රාජ්‍ය අමාත්‍යවරයන්ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් පත්කරන ලදී.

**2020 අගෝස්තු මස 14 වැනි සිකුරාදා**
නවවැනි පාර්ලිමේන්තුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර 29න් තෝරාපත් කර ගන්නා ලද තවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් 08 දෙනකුගේ නම් මැතිවරණ කොමිසම විසින් 2020 අගෝස්තු මස 14 වැනි දිනැති අංක 2188/46 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ පළ කරන ලදී.

**2020 අගෝස්තු මස 20 වැනි බ්‍රහස්පතින්දා**
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 ව්‍යවස්ථාව ප්‍රකාරව අභිනව නවවැනි පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම පූර්ව භාග 9.30ට කැඳවන ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා 2020 අගෝස්තු මස 13 වැනි දිනැති අංක 2188/39 දරන අති විශේෂ ගැසට්පත්‍රය නිකුත් කළේය.

## නවවැනි පාර්ලිමේන්තුවේ

- කථානායක ධුරයට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාද,

- නියෝජ්‍ය කථානායක ධුරයට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රංජිත් සියඹලාපිටිය මහතාද,

- නියෝජ්‍ය කාරක සභා සභාපති ධුරයට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අංගජන් රාමනාදන් මහතාද

පාර්ලිමේන්තුව විසින් තෝරාපත් කර ගන්නා ලදී.







- පාර්ලිමින්තුවේ සභානායක ධූරය සඳහා ගරු දිනේෂ් ගුණවර්ධන මහතාද,

- ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ධූරය සඳහා ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාද, පත්කර ඇති බවත්,

- විරුද්ධ පාර්ශ්වයේ නායක වශයෙන් ගරු සජිත් ප්‍රේමදාස මහතා පාර්ලිමේන්තුව විසින් පිළිගන්නා ලද බවත්,

පාර්ලිමේන්තුවේ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් නිවේදනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් අපර භාග 3.00ට ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන ලදී.

**2020 සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා**
හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව සම්බන්ධයෙන් කථා පවත්වා අවසන් කරන ලදී.

**2020 සැප්තැම්බර් මස 22 වැනි අඟහරුවාදා**
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ

**"විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය"**
නමැති පනත් කෙටුම්පත අධිකරණ අමාත්‍ය, ගරු අලි සබ්රි මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**2020 ඔක්තෝබර් මස 20 වැනි අඟහරුවාදා**
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝගයට ලක්කරන ලද

**"විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය"**
නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීරණය පාර්ලිමේන්තුවේ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් නිවේදනය කරන ලදී.

එදිනම, 2020 හා 2021 වර්ෂ සඳහා විසර්ජන පනත් කෙටුම්පත් දෙකක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගන්වන ලදී.

**2020 ඔක්තෝබර් මස 21 වැනි බදාදා සහ 22 වැනි බ්‍රහස්පතින්දා**
**"විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය"** නමැති පනත් කෙටුම්පත දෙදිනක විවාදයකින් පසුව ඡන්ද විමසීමෙන්;

- දෙවැනි වර කියවීම සහ තුන්වැනි වර කියවීම පක්ෂව 156ක්ද, විරුද්ධව 65ක්ද, වශයෙන් බෙදී තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් සංශෝධන සහිතව පාර්ලිමේන්තුවේදී සම්මත කරන කෙරිණි.



**2020 නොවැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා**
2020 වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත දෙවැනි වර කියවා සංශෝධන සහිතව පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

**2020 නොවැම්බර් මස 17 වැනි අඟහරුවාදා**
2021 වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත - දෙවැනි වර කියවීම (අයවැය කථාව) අපර භාග 1.40ට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මහතා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

**2020 නොවැම්බර් මස 18 වැනි බදාදා සිට දෙසැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා දක්වා**
2021 වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමේ හා කාරක සභා අවස්ථාවේ විවාද සෙනසුරාදා තුනක්ද ඇතුළුව අවසාන කර,

- දෙවැනි වර කියවීම 2020 නොවැම්බර් මස 21 වැනි සෙනසුරාදා පක්ෂව 151 ක්ද, විරුද්ධව 52 ක්ද,

- තුන්වැනි වර කියවීම 2020 දෙසැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා පක්ෂව 151 ක්ද, විරුද්ධව 54 ක්ද,

වශයෙන් බෙදී සංශෝධන සහිතව පාර්ලිමේන්තුවේදී සම්මත විය.

**2020 දෙසැම්බර් මස 18 වැනි සිකුරාදා**
නවවැනි පාර්ලිමේන්තුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර 29න් තෝරාපත් කර ගන්නා ලද තවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ (ගරු පූජ්‍ය) අතුරලියේ රතන හිමි) නම මැතිවරණ කොමිසම විසින් විසින් 2020 දෙසැම්බර් මස 18 වැනි දිනැති අංක 2206/22 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ පළ කරන ලදී.

ඊට අමතරව, මෙම වර්ෂය තුළදී අටවැනි පාර්ලිමේන්තුවේදී එක් පනත් කෙටුම්පතක්ද, නවවැනි පාර්ලිමේන්තුවේදී පනත් කෙටුම්පත් හයක්ද, සම්මත කර කථානායකවරයා විසින් යථා පරිදි සහතිකය සටහන් කරන ලදී.

අටවැනි පාර්ලිමේන්තුව 2020 මාර්තු මස 02 වැනි දින විසුරුවා හැරීමට පෙර පාර්ලිමේන්තුවේ රැස්වීම් දින 14ක්ද, නවවැනි පාර්ලිමේන්තුව 2020 අගෝස්තු මස 20 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා පාර්ලිමේන්තුවේ රැස්වීම් දින 44 ක්ද, ව්‍යවස්ථාදායක වැඩ කටයුතු සඳහා පැවැත්විණ.



**එච්. ඊ. ජනකාන්ත සිල්වා**
*සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)*
*සභා ලේඛන කාර්යාංශය*
*ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව*

**පුවත්**

# රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට නව සාමාජිකයින් දෙදෙනෙක්





රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ නව සාමාජිකයින් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී කුමාර වෙල්ගම මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී මනූෂ නානායක්කාර මහතා පත් කර ඇති බව ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී නිවේදනය කළේය.

මෙම කාරක සභාවේ සාමාජිකයින් ලෙස කටයුතු කළ පාර්ලිමේන්තු මන්ත්‍රී චමින්ද විජේසිරි මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ මහතා ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩු සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව මෙම පත්කිරීම් සිදුකර තිබේ.

විශේෂාංග

# ළාබාලතම මන්ත්‍රීනී තමරා කුමාරි ඉලංගරත්න

**"දහඩිය මහන්සිය සොරකම් කිරීම පාපයකි. දුගී දුප්පත් වැඩකරන ජනතාව අධිරාජ්‍යවාදීන්ගෙන් සහ ධනේශ්වර පන්තියෙන් ග්‍රහණයෙන් සුරකිමු"**

*- තමරා කුමාරි ඉලංගරත්න -*



ළාබාලතම මන්ත්‍රීවරියක් ලෙසින් දේශපාලනය තුළ සිය නාමය රැන්දූ තමරා කුමාරි අළුදෙණිය කෑගල්ලේ වේරකේ ගම්මානයේ 1925 මාර්තු 15 වන දින ජන්මලාභය ලැබුවාය. පී. බී. අලුදෙණිය මහතාගේ දියණිය වූ ඇයට සහෝදර සහෝදරියන් සිව් දෙනෙකි. ඈ රජයේ ලිපිකාර මහතකු වූ තම පියා රාජකාරි කළ ගම්පොළ ප්‍රදේශයේ සිය ළමා කාලය ගෙවූවාය. පසුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ලබා ගැනීමට සමත් වූ ඈ ගම්පොළ ශාන්ත ජෝශප් කන්‍යාරාමයේ නේවාසිකව අධ්‍යාපනය ලැබුවාය.

පියාගේ යෝජනාවකට අනුව දෙපස ඥාතීන්ගේ ආශිර්වාදය මධ්‍යයේ 1944 සැප්තැම්බර් 04 වන දින ටිකිරි බණ්ඩා ඉලංගරත්න මහතා, තමරා කුමාරි අළුදෙණිය මෙනෙවිය සමඟ ගම්පොළ උනම්බුව ප්‍රදේශයේදී විවාහ විය. සමාජවාදී දර්ශනයට ළැදි ටිකිරි බණ්ඩා ඉලංගරත්න රාජ්‍ය ලිපිකරු සේවා සංගමයේ සභාපති පදවියද දැරුවේය.



1947 දී පැවති යු.ඇන්.පී. ආණ්ඩු විරෝධී මහා වැඩ වර්ජනයේ නායකත්වය දැරීමට ඔහුට සිදුවීමේ ප්‍රතිඵලය ලෙස ටී. බී. ඇතුළු පිරිසට රැකියාව අහිමි විණි. ඉන්පසු ස්වාධීන සමාජවාදී අපේක්ෂකයෙකු ලෙස මහනුවර ප්‍රදේශයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ ඉලංගරත්න මහතා 1948 මැයි 18 වන දින පාර්ලිමේන්තුවේදී දිවුරුම් දුන් ඔහු සාර්ථක දේශපාලඥයෙකු ලෙස සිය ගමන ආරම්භ කළේය. ඉලංගරත්න මහතා සේවක අර්ථ සාධක අරමුදල, ජාතික බැංකුව හා ශ්‍රී ලංකාවේ කම්කරු දිනය ආරම්භ කිරීමට පුරෝගාමී වූවෙකි. ඉලංගරත්න මහතාට එරෙහිව විභාග වූ ඡන්ද පෙත්සමක් හේතුවෙන් මන්ත්‍රීකම මෙන්ම ප්‍රජා අයිතියද අහෝසි විය. 1986 අප්‍රේල් 12 වන දින මහනුවර අසුන අහිමිවීමෙන් අනතුරුව ඔහුට දේශපාලනයෙන් සමුගැනීමට විය.

මුලින්ම, එම අතුරු මැතිවරණයේදී මහනුවර ආසනයට තරඟ වැදීමට තමරා කුමාරි ඉලංගරත්න එතරම් සුදුසු නොවූ බව වමේ මතය විය. එයින් නොනැවති, තමරාට එරෙහිව ඡන්ද පෙත්සමක් පවා නිර්මාණ විය. එය චෝදනා රැසකින් යුක්ත විය. ප්‍රජා අයිතිය අහිමි වූ සැමියා දේශපාලන වැඩවලට හවුල්වීම බරපතළ චෝදනාව වූ අතර ඒ කරුණු සනාථ කිරීමට ඡායාරූප සාක්ෂි සමඟ නීතිඥයන්ගේ තර්ක විතර්ක මැද ඡන්ද පෙත්සම ප්‍රතික්ෂේප කිරීමට සිදුවිණ.

1949 ජුනි 18 දින පැවති අතුරු මැතිවරණයට තරුව සලකුණෙන් තරඟ කළ තමරා කුමාරි ඉලංගරත්න මහත්මිය ඡන්ද 10062ක් (මුළු ඡන්දයෙන් 50.75%) ලබා ගත් අතර වැඩි ඡන්ද 2056කින් සෝල්බරි පාර්ලිමේන්තුවට පත් වූ තුන්වෙනි මන්ත්‍රීවරිය ලෙස තමරා කුමාරි ඉලංගරත්න අතුරු මැතිවරණය ජයගත්තාය.

ලංකාවේ පළමු වැනි පාර්ලිමේන්තුව නියෝජනය කළ ඇඩ්ලින් මොලමුරේ, කුසුමා ගුණවර්ධන සහ තමරා කුමාරි ඉලංගරත්න මහත්මීන් තිදෙනාගේ පාර්ලිමේන්තු ආගමනයට ඔවුන්ගේ පවුල් පසුබිම හෝ ස්වාමිපුරුෂයන්ගේ දේශපාලන බලය ප්‍රබල හේතුවක් විය. ග්‍රාමීය ලාංකීය කාන්තාවන් වෙනුවෙන් එදා තමරා කුමාරි ඉලංගරත්න පෙරමුණට පැමිණියේ **"තම රට බේරාගන්න තමරාට ඡන්දේ දෙන්න"** යන සටන් පාඨය පෙරාදැරි කොටගෙනය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආරම්භක සමයේදී බොහෝ කම්කටොලු වලට මුහුණ දෙමින් පක්ෂය ජනතාව අතර ප්‍රචලිත කිරීමට කටයුතු කළ ඇය එම පක්ෂය නියෝජනය කළ වාමාංශික මතධාරිනියක් වූවාය. ඇය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහිකිරීමේදී ද එහි එකම කැඳවුම්කාරිනිය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එකම ආරම්භක සාමාජිකාව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රථම මන්ත්‍රීවරිය, සිරිමාවෝ

බණ්ඩාරනායක මැතිනියට පෙර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කාන්තා සම්මේලනයේ ප්‍රථම සභාපතිනිය, කථානායක අසුනේ අසුන්ගත් ප්‍රථම කාන්තාව ලෙස පිදුම් ලැබූ අතර ආණ්ඩුකාර ධුරයට යෝජනා වූ මෙරට ප්‍රථම කාන්තාව ද වූවාය. එනමුත් තරුණයෙකුට එම ආණ්ඩුකාර ධුරය ලබාදෙන මෙන් එම ඉල්ලීම ගෞරවයෙන් ප්‍රතික්ෂේප කළාය.




තමරා සැලකෙන්නේ ගෘහණියන් වූ ලාංකීය කාන්තාව දේශපාලන කරළියට ඔසවා තබමින් චීනය, කොරියාව, ඉන්දියාව, චිලී රට හා රුසියාව වෙත ශ්‍රී ලාංකීය කාන්තා අභිමානය ගෙන ගිය විරෝදාර කතක් ලෙසිනි. ලොව ප්‍රථම අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය දේශපාලනයට පිවිසීමට ප්‍රථම 1948 -1949 වසරේදී, විසිපස් වියැති තමරා කුමාරි ඉලංගරත්න, බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනයට සහ එවකට අධිරාජ්‍ය ගැති පක්ෂවලට එරෙහිව, මන්ත්‍රීවරියක් ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහනුවර ආසනය නියෝජනය කරමින් ස්වාධීන සමාජවාදී නිර්ධන පංතියේ ප්‍රථම කාන්තා මන්ත්‍රීවරිය සහ නායිකාව ලෙස ලංකා ඉතිහාසයට එක්වූවාය.

ශ්‍රී ලංකාවේ දෙවන මහ මැතිවරණය 1952 මැයි මස 24, 26, 28 සහ 30 දිනවල පැවැත්වුණු අතර කුඩය යටතේ තමරා මහනුවර අසුනට සටන් වැදුණාය. එහිදී ඇයගේ ප්‍රතිවාදියා වූයේ එක්සත් ජාතික පක්ෂයේ බලවතකු වූ ඊ. ඇල්.සේනානායකය. 1952 දෙවන පාර්ලිමේන්තු මැතිවරණයේදී ඇය සිය ආසනය රඳවා ගැනීමට අපොහොසත් වූ අතර, ඉලංගරත්නගේ ඡන්ද 7644ට වඩා ඡන්ද 11349ක් ලබාගත් එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයාට පරාජය විණි.




දේශපාලනයට ඉදිරිපත්වීම ගැන ඇයගේ ඥාතීහු බලවත් ලෙස විරෝධය පෑහ. ඒ වනවිට දරු ප්‍රසූතිය ලැබ මවකව සිටි ඈ සැමියාගේත්, පක්ෂයේත් ගෞරවය වෙනුවෙන් දේශපාලනයේ නිරත වූවාය. ඇය සංවේදී, දිරිය කතක් වූ අතර ආදරණීය මවක් විය. මන්ත්‍රීවරියක වූ පසුවත් ඇය සිය කුටුම්බය හා දේශපාලනය අතර දෝලනය වූවාය.

එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමන්, අධිරාජ්‍යවාදී ගැති, නිර්ධන පංති විරෝධී එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල ඇමති ධුර දරන අවධියේදී, ටී. බී. ඉලංගරත්න සහ තමරා කුමාරි ඉලංගරත්න මහතා සහ මහත්මිය එක්සත් ජාතික පක්ෂයට එරෙහිව ස්වාධීන සමාජවාදී මන්ත්‍රීවරුන් ලෙස පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට තරම් ප්‍රගතිශීලී සහ එක්සත් ජාතික පක්ෂ විරෝධී වූහ. ඒ අනුව 1952 දක්වාම ඇය මැතිසබය නියෝජනය කළාය.




සන්ධ්‍යා,රෝහිණී,උපේක්ෂා සහ උදය නම් වූ දරුවන් සිව් දෙනෙකුගේ ආදරණීය මව වූ ඇගෙන් පසු ඔවුන්ගේ පවුලෙන් කිසිදු කෙනෙක් දේශපාලනයට අවතීර්ණ නොවීම විශේෂත්වයකි. 1998 දී ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමන් විසින් පිරිනමන ලද දේශමාන්‍ය ජාතික සම්මානය තමරා කුමාරි ඉලංගරත්න මහත්මිය විසින් හිමි කර ගන්නා ලදි.

**ඩොරින් වික්‍රමසිංහ මැතිනියගේ** දේශපාලන තතු පිළිබඳ ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න.

*ඉෂාරා වික්‍රමසිංහ*
*මහජන සේවා නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

# විදෙස්ගත ශ්‍රමිකයන් මෙරටට ගෙන්වා ගැනීමට විදේශ සේවා නියුක්ති කාර්යංශය සතු අරමුදල් යොදා ගන්න - කෝප් කමිටුව



**විදේශ සේවා නියුක්ති කාර්යංශය සතු අරමුදල් භාවිත කොට කොවිඩ් ව්‍යසනය නිසා අසරණව සිටින විදෙස් ගත ශ්‍රමිකයන් මෙරටට ගෙන්වා ගැනීම සඳහා කටයුතු කිරීමේ හැකියාව පිළිබඳ සොයා බලන ලෙස පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප් කමිටුව) විදේශ සේවා නියුක්ති කාර්යංශයේ නිලධාරීන් වෙත දැනුම් දුන්නේය.**

කමිටුව මේ බව සඳහන් කළේ විදේශ රැකියා ක්ෂේත්‍රයෙහි වර්තමාන තත්ත්වය අධ්‍යනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත් මහතාගේ සභාපතීත්වයෙන් පසුගියදා රැස්වූ අවස්ථාවේදීය.

විදේශ සේවා නියුක්ති කාර්යංශය රැස් කොට ඇති රුපියල් බිලියන 14ක ජංගම වත්කම් යොදවා මේ වන විට කොවිඩ් ව්‍යසනය හේතුවෙන් විවිධ රටවල අසරණව සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් නැවත මෙරටට ගෙන්වා ගැනීමට කිසියම් නෛතික බාධාවන් තිබේද යන්න කමිටුව විසින් විමසන ලදී. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචිව සිටින විදෙස්ගත ශ්‍රමිකයන් සිය අරමුදල් භාවිත කොට මෙරටට ගෙන්වා ගැනීමේ කිසිඳු බාධාවක් නොමැති බව කාර්යංශ සභාපතිවරයා අනාවරණය කළේය.

මැදපෙරදිග තෙල් මිල පහල යාම හේතුවෙන් රැකියා අහිමිවූවන් සහ කොවිඩ් ව්‍යසනය හේතුවෙන් රැකියා අහිමි වූ ශ්‍රමිකයන් 34721ගෙන් තමන්ව මව් රටට ගෙන්වා ගන්නා ලෙස මේ වන විටත් විදේශ සේවා නියුක්ති කාර්යංශයෙන් ඉල්ලීම් කොට තිබේ.

කොවිඩ් වසංගතය හමුවේ රට විවෘත කිරීමේ සාකච්ඡා පවතින මොහොතක සහ මේ වන විටත් ගුවන් තොටුපල විවෘතව ඇති නිසාවෙන් මෙසේ මව් රටට ගෙන්වා ගන්නා ලෙස ඉල්ලීම් කරන විදෙස්ගත ශ්‍රමිකයන් පිළිබඳ සොයා බැලීම සඳහා කාර්යාංශය විසින් සුදුසු ආකෘතියක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවයද කෝප් සභාපතිවරයා මෙහිදී පෙන්වා දුන්නේය.

2019 වර්ෂය සඳහා පමණක් විදෙස් රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සේවය කරන ලාංකික නිලධාරීන් වෙනුවෙන් වියදම් කොට ඇති මුදල රුපියල් මිලියන 800ක් බව අනාවරණය වූ අතර එතරම් විශාල මුදලක් වැයකොට නඩත්තු කරන සේවක පිරිසෙන් අපේක්ෂිත සේවාවන් ඉටු වනවාද යන්න සොයා බැලිය යුතු බව කෝප් කමිටුව නිලධාරීන් වෙත දැනුම් දුන්නේය.

විදේශ රටවල පවතින ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල වල සේවය කිරීම සඳහා නිලධාරීන් බඳවා ගැනීමේදී විධිමත් ක්‍රියාපටිපාටියක් අනුගමනය කරන ලෙස කොප් කමිටුව දැනුම් දුන් අතර එසේ නොකිරීම නිසා පසුගිය කාලය පුරාම විවිධ අක්‍රමිකතා සිදු වී ඇති බවද අවධාරණය කළේය.

මෙම රැස්වීමට අමාත්‍යවරුන් වන අජිත් කබ්රාල්, මහින්ද අමරවීර, ඉන්දික අනුරුද්ධ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන පාඨලී චම්පික රණවක, නලීන් බණ්ඩාර, එරාන් වික්‍රමරත්න ඇතුළු විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධක අමාත්‍යංශය, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාරයංශයේ නිලධාරීහු පිරිසක්ද සහභාගී වූහ.



# ජෝ බයිඩන්; වෙනස් කතාවක් අභියෝග රැසක්



**කොරෝනා වසංගතය හමුවේ උඩු යටිකුරු කෙරුණු සන්දර්භයක පැවති මෙවර ඇමෙරිකානු ජනාධිපතිවරණය අන් කවරදාකටවත් වඩා ලෝකයේ බොහෝ රටවල අවධානය දිනාගත්තක් විය. පැවති මැතිවරණය සඳහා රිපබ්ලිකන් පක්ෂය වෙනුවෙන් ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් තරඟ වැදුණු අතර ඩිමොක්‍රටික් පක්ෂය වෙනුවෙන් ජෝ බයිඩන් තරඟ බිමට පිවිසියේය.**

අත්දැකීම් බහුල, පරිණත දේශපාලනඥයෙකු වන ඔහු, අට වසරක් ජනාධිපති බරාක් ඔබාමාගේ උප ජනාධිපතිවරයා වශයෙන් කටයුතු කළේය. දෙවන ලෝක සංග්‍රාමය පෙරට යමින් පවතින අතර වර්ෂ 1942 දී පෙන්සිල්වේනියා ප්‍රාන්තයෙහි උපන් බයිඩන් දරුවන් සිවුදෙනකුගෙන් යුතු පවුලක වැඩිමලාය.

අධ්‍යාපන කටයුතුවලට මෙන්ම ක්‍රීඩා කටයුතුවලට දක්ෂතා දැක් වූ බයිඩන්, ඉතිහාසය හා දේශපාලන විද්‍යාව පිළිබඳ ඩෙල්වෙයාර් විශ්වවිද්‍යාලයට ඇතුළත්ව උපාධියක් ලබා ගත් අතර, අනතුරුව ඔහුගේ අධ්‍යාපන ආයතනය වූයේ 'Syracuse' සරසවියේ නීති පීඨයයි.

පවුලේ සහ සරසවියේ සගයන් අතර ඔහු හැඳින්වූයේ මහන්සියෙන් ජීවිතය දිනගත්තෙකු ලෙසිනි. ළාබාලතම සෙනෙට් සාමාජිකයෙකු ලෙස ජෝ බයිඩන් දේශපාලනික කටයුතු කළද ඔහුගේ බිරිඳ සහ කුඩා දියණිය මෝටර්රථ අනතුරකින් ජීවිතක්ෂයට පත්වීමෙන් ඔහු දැඩි ලෙස සසල වූ නමුදු දැඩි මානසික පසුබෑම් හමුවේ මනස ශක්තිමත් කර ගනිමින් දැඩි අධිෂ්ඨානයකින් යුතු තනි පියෙකු ලෙස සිය දේශපාලන දිවියේ ඉදිරියට යාමට උත්සාහ ගත්තේය.



වර්ෂ 1987, බයිඩන්ගේ ජීවිතයේ සුවිශේෂී සන්ධිස්ථානයකි. එම වසරේ ඇමෙරිකානු ජනාධිපතිවරණයේ අපේක්ෂකත්වය සඳහා ඉදිරිපත් වුවද ඔහු පසුව, ආන්දෝලන මධ්‍යයේ සිය නම තරඟයෙන් ඉවත්කර ගත්තේය. 2008 වසරේදීද ජනාධිපතිධුරය සඳහා බයිඩන් ගත් උත්සාහය අසාර්ථක වුවද 2008 අගෝස්තු 23 වෙනිදා බරක් ඔබාමා විසින් සිය උප ජනාධිපති අපේක්ෂකයා ලෙස හඳුන්වා දෙනු ලැබුවේ ජෝ බයිඩන්ය. මෙය බයිඩන්ගේ ජීවිතය වෙනම දිශානතියක් කරා යොමු කර වූ අතර ඔවුන් දෙදෙනා අතර තිබුණේ දැඩි හෘදයාංගම සබැඳියාවකි.

එනිසා බයිඩන් විසින් නිතරම ඔබාමා අමතනු ලැබුවේ "සහෝදරයා" යනුවෙනි. වරෙක, රටේ පුරවැසියකුට පිරිනමන ඉහළම සම්මානය වන නිදහස පිළිබඳ ජනාධිපති සම්මානයෙන් බයිඩන් පිදුම් ලැබුවේය. එම අවස්ථාවේදී "ජෝ බයිඩන් හඳුනාගැනීම යනු රැවටිල්ලකින් තොර දයාව හඳුනාගැනීමයි, පෞද්ගලික අභිමතාර්ථයෙන් තොර සේවය වගේම ජීවිතය පරිපූර්ණව ගෙවීමය" යැයි ජනාධිපති ඔබාමා ප්‍රකාශ කළේය.

2016 වර්ෂයේ දී බයිඩන්ගේ වැඩිමහල් පුත්‍රයා වූ බියු බයිඩන් වයස අවුරුදු 46 දී ඇති වූ පිළිකාවක් හේතුවෙන් මරණයට පත් වීම බයිඩන්ගේ ජීවිතයේ තවත් ඛේදනීය කළේය. එතැන් පටන් පිළිකා රෝගයෙන් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් ඔහු විසින් සහන රැසක් සලසා දෙන ලදී. ජීවිතයේ නොයෙකුත් අභියෝග



හමුවේ කෙටි කලකට දේශපාලන ජීවිතයෙන් මිදුණු බයිඩන් නැවතත් 2020 වසරේ ජනාධිපතිවරණයට ඉදිරිපත් වූයේ ඇමරිකානුවන්ට ප්‍රජාතන්ත්‍රවාදය හා සාධනීය නව බලාපොරොත්තු රැසක් එක් කරමිනි. ජනපති ට්‍රම්ප් හා පැවති අවසන් රූපවාහිනී සංවාදය ද බයිඩන්ගේ නියත ජය තහවුරු කරන්නක් විණි.

කොරෝනා වෛරසය සම්බන්ධයෙන් ජනාධිපති අපේක්ෂක ප්‍රතිවාදීන් දෙදෙනාගේ ඇති බෙදීම ගැඹුරට විහිදී ගිය අවස්ථාවේදී දේශගුණික විපර්යාස, පරිසර දූෂණය, ගෝලීය උණුසුම, ඉහළ යෑම වැනි කරුණු පිළිබද සංවේදී වූ බයිඩන් රටෙහි ආර්ථිකය පාලනය කරන පරිද්දෙන්ම පාරිසරික ගැටලු සඳහා විසදුම් සොයා යෑමද අත්‍යවශ්‍ය කාරණාවක් බව ලොවට පසක් කළේය.

එමෙන්ම, මුස්ලිම් හා කළු ඇමෙරිකානුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ හඬ නැගීමද සිය උපජනාධිපතිවරිය ලෙස කමලා හැරිස් තෝරගෙැනීමද සපුරා ට්‍රම්ප්ගේ මතවාදයන්ට ප්‍රතිපක්ෂ මාවතක් බයිඩන් තෝරාගත් බවට පැහැදිලි සංඥා විය. සැක සංකා මධ්‍යයේ අවසානයේදී, මෙවර ජනාධිපතිවරණයේදී ඡන්ද විද්‍යාල 270කට වැඩි ප්‍රමාණයක් ජයග්‍රහණය කරමින්, ඇමරිකානු ජනාධිපතිවරණ ඉතිහාසයේ වැඩිම මනාප සංඛ්‍යාවක් ලබා ගැනීමට බයිඩන්ට හැකියාව ලැබිණි.

මැතිවරණයෙන් පසුව ප්‍රථම වරට NBC News සමඟ කළ සාකච්ඡාවේදී බයිඩන් ප්‍රකාශ කළේ තමන්ට මුහුණ දෙන්නට සිදුව තිබෙන අභියෝගයන් "සුවිශේෂී" ඒවා බවයි. වරෙක එක්සත් ජනපදයේ ජනාධිපති පදවියට පත්වීමට ලැබීම "ගෞරවයක්" වන අතර එය ඉතා නිහතමානීව පිළිගන්නා බව

ජෝ බයිඩන් හෘදයාන්තරයෙන් පැවසීය. එමෙන්ම "පෙර නොවූ විරූ ආකාරයේ බාධක හමුවේ, වාර්තාගත ඇමෙරිකානුවන් පිරිසක් සිය ඡන්දය භාවිත කළහ. ඇමරිකාවේ හෘදයාන්තරයේ ප්‍රජාතන්ත්‍රවාදය ස්වච්ඡන්දනය වන බව එමගින් ඔවුහු යළිත් වරක් සනාථ කළහ" යනුවෙන් ඔහු කියා සිටියේය. එමෙන්ම "කෝපය සහ පොතේ ගුරුවාදය පසෙක දමා ජාතියක් ලෙසින් එක්ව කටයුතු කිරීමට" කාලය එළඹ තිබෙන බව පැවසූ නව ජනපති පදවියට තේරී පත් වී සිටින ජෝ බයිඩන්, "මේ තුවාල සුවකිරීමට සහ ඇමෙරිකාවට එකමුතු වීමට කාලයයි" යනුවෙන්ද සඳහන් කළේය. ට්විටර් පණිවුඩයක් මඟින්ද ඔහු පැවසුවේ අනාගතය දුෂ්කර වුවත් මින් අනතුරුව තමන් ඡන්දය දුන්, නුදුන් සියලුම ඇමෙරිකානු වැසියන්ගේ ජනපතිවරයා ලෙසින් කටයුතු කරන බවයි.

වරෙක, ඉරාක යුද්ධය වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කළ බයිඩන් එය තමා අතින් සිදු වූ වරදක් බව නිහතමානීව පිළිගත්තේ නායකයෙක් ලෙස රටට පූර්වාදර්ශයක් සපයමිනි. එමෙන්ම ඔහුට මෙම අතිවිශිෂ්ට ජයග්‍රහණය හිමි වූයේ වයස අවුරුදු 78දීය.

සිය ජීවිතයේ සාර්ථකත්වය කරා යෑමට තම වයස බාධාවක් නොවන බවත් ජීවිතයේ අප ලබන නොයෙකුත් අභියෝග, පරාජයන් සහ බිඳ වැටීම් හමුවේ දිගින් දිගටම උත්සාහ කිරීම තුළින් කෙදිනක හෝ ජයග්‍රහණය ලැබිය හැකි බවත් ඔහු සිය ජීවිත කතාව තුළින් ලෝකයාට පෙන්වා දුන් ඇමරිකානු ජනාධිපතිධුරයේ පසුගිය ජනවාරි 20වන දින දිවුරුම් දුන් බයිඩන් වෙත ඇත්තේ ළඟාවීමට පහසු ඉලක්ක නොවන බව දේශපාලන විචාරකයන්ගේ මතයයි.

**ඇමරිකානු උපජනාධිපතිනි කැමලා හැරිස්** සමඟ ලබන කලාපයෙන් හමුවෙමු.


***නිපුනි බලගමගේ***
***මහජන සේවා නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***




# ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට 2020 වර්ෂයේ ඩොලර් මිලියන 300ක ඉතිරියක් - කෝප් කමිටුවේදී අනාවරණය වෙයි





ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට 2020 වසර තුළ ඩොලර් මිලියන 300ක විදේශ විනිමය ඉතිරියක් සිදුවූ බව එහි සභාපති සුමිත් විජේසිංහ මහතා කෝප් කමිටුවේදී පැවසීය.

ඛනිජ තෙල් ගබඩා කිරීමට සහ බෙදාහැරීමට අදාළ විශේෂ විගණන වාර්තාව පිලිබඳ සාකච්ඡා කිරීමට මහාචාර්ය චරිත හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් කොප් කමිටුව පසුගියදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයා අදහස් දක්වමින් මෙම තොරතුරු ප්‍රකාශ කළේය.

විශේෂයෙන් පසුගිය වසර තුළ බොරතෙල් බැරලයක මිල පහළ යාම නිසාත් තවත් හේතු කිහිපයක් නිසාත් මේ වාසිය ලබාගැනීමට හැකි වූ බව ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයා මෙම තොරතුරු සඳහන් කළේ පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.එම්. මරික්කාර් මහතා බොරතෙල් මිල අඩු වීම නිසා පසුගිය වසර තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලැබුණු ලාභය පිළිබඳ කොප් කමිටුවේදී කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින්ය.

අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ, අමාත්‍ය මහින්ද අමරවීර, රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ, පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් වන පාඨලී චම්පික රණවක, අනුර කුමාර දිසානායක, නලීන් බණ්ඩාර, එරාන් වික්‍රමරත්න, ප්‍රේම්නාත් සී. දොළවත්ත, එස්.එම්. මරික්කාර්, ශානක්‍යම් රාසමානික්කම් යන මහත්වරු මීට සහභාගි වූහ. නිරීක්ෂක මන්ත්‍රීවරයෙකු ලෙස ඉසුරු දොඩන්ගොඩ මහතා ද මීට සහභාගී විය.

ත්‍රිකුණාමලය ප්‍රදේශයේ සහ හම්බන්තොට ප්‍රදේශයේ පවතින තෙල් ටැංකි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවශ්‍යතා සඳහා යොදාගැනීමේ හැකියාව පිළිබඳවද මෙහිදී කෝප් කමිටුවේ අවධානය යොමුවිය.

ඉන්ධන ගබඩාකොට තැබීම ධාරිතාවය වර්ධනය කිරීමට මුතුරාජවෙල සහ කොළොන්නාව පර්යන්තවල කටයුතු ආරම්භ කොට ඇති බවද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරීහු මෙහිදී පැවසූහ. මෙම හැකියාවන් පිළිබඳ ඉක්මනින් ශක්‍යතා අධ්‍යනයක් සිදුකොට කෝප් කමිටුවට වාර්තාවක් ලබාදීමට කෝප් කමිටු සභාපතිවරයා මෙහිදී නිර්දේශ කළේය.



# ‘එක් තීරයක් එක් මාවතක් සංකල්පය’

# පෙරදැරි කොට ගත් චීනයේ නව සේද මාවත

නව සේද මාවත ලෙස හැඳින්වෙන චීනයේ “එක් තීරයක් එක් මාවතක්” (One Belt - One Road Initiative) හෙවත් OBOR සංකල්පය මෙතෙක් සංකල්පනය කර ඇති වඩාත්ම අභිලාෂිත යටිතල පහසුකම් ව්‍යාපෘතියක් මෙන්ම නියත ලෝක, ආර්ථිකමය හා දේශපාලනික හැරවුම් ලක්ෂයක් වශයෙන්ද හඳුන්වා දිය හැකිය. 2013 වසරේදී ජනාධිපති ෂී ජිංපිං (Xi Jinping) මහතා මෙම සංකල්පය ලොව හමුවේ තබන අතර, එය සංකල්පමය වශයෙන් ලොව හමුවට ගෙන එනු ලබන්නේ 2015 වර්ෂයේදීය.

රටවල් 65ක් හරහා දිවෙන ගොඩබිම් මාර්ග හා මුහුදු මාර්ග යා කරන්නාවු ජාලයක් ඔස්සේ ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකක් සම්බන්ධ කිරීම එහි ප්‍රධාන ඉලක්කගත අරමුණයි.

කෙසේ වුවද සේද මාවත ලෝකයට නව හඳුන්වාදීමක් නොවේ. පුරාණ ඉතිහාසයේ සේද මාවත ගොඩ නැගුනේ චීනයේ හාන් රාජවංශයේ බටහිර දෙසට ව්‍යාප්ත වීමත් සමඟය. වසර 1000 කට වැඩි අතීතයකට දිව යන චීනය හා ඉන්දියන් සාගරය ආශ්‍රිත රටවල් සමඟ පවත්වන වෙළඳාම ඇතුළු සම්බන්ධතා ඔස්සේ චීනය බාහිර ලෝකයට පිවිසි අතර පසුව අනුක්‍රමයෙන්





විවිධ ජාතීහු සේද මාවත තම ප්‍රධාන වාණිජ ප්‍රවේශය ලෙස පිළිගත්තෝය. එලෙස පැරණි මුහුදු සේද මාවත, ආසියාව, අප්‍රිකාව හා යුරෝපය යන මහද්වීප තුනම යා කරන ප්‍රධාන ගමන් මාර්ගය බවට පත් විය. එකී පෙර අභිමානයටම ඓතිහාසික සේද මාවතට යළි පණ දීම චීනයේ අභිප්‍රායයි.

ෂී ජිංපිං (Xi Jinping) ජනාධිපතිවරයාගේ එක් තීරයක් එක් මාවතක් සංකල්පය තුළ මූලික හරයන් පහක් හඳුනාගත හැක. එනම්;

1. ප්‍රතිපත්ති සම්බන්ධීකරණය (Policy Coordination) හෙවත් සාර්ව ප්‍රතිපත්ති සම්බන්ධයෙන් රාජ්‍යයන් අතර සම්බන්ධීකරණය අපේක්ෂා කිරීම.

2. සම්බන්ධතාවය (Facility connectivity) මත පදනම්ව ආසියානු, යුරෝපීය සහ අප්‍රිකානු මහාද්වීප අතර සහයෝගීතාවය ගොඩනැගීම තුළින් ගෝලීය නිදහස් වෙළඳ තන්ත්‍රය සහ විවෘත ලෝක ආර්ථිකය ප්‍රවර්ධනය මූලික කොට ගත් වෙළෙඳ ආයෝජන අවස්ථාවන් ගොඩනැගීම.

3. මූල්‍යය සහසම්බන්ධතාවය (Financial integration) හෙවත් සියලු මානයන්, බහු ස්ථර සහ සංයුක්ත මූල්‍ය සම්බන්ධතා ජාලයන් සැකසීම සඳහාත්, මූල්‍යය සහයෝගීතාවයක් ඇති කිරීම සඳහාත් පහසුකම් සැපයීම.






4. ගැඹුරු වෙළඳ සබඳතාවයන් ගොඩනැංවීම (Trade deepening) තුළ අවම වෙළඳ බාධක හරහා මෙම කලාපයේ වෙළඳපල විභවයන් මුදා හැරීම, ආයෝජන හා පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම මෙන්ම විවෘත රැකියා ආර්ථිකයේ රැකියා අවස්ථා සහ කාර්යක්ෂම නියාමන යාන්ත්‍රණයක් ඇති කිරීම.

5. සංස්කෘතික සහසබඳතාවය (Cultural integration) ඔස්සේ සංස්කෘතික හා අධ්‍යාපන හුවමාරුව, පුද්ගල හුවමාරුව, සංචාරක ප්‍රවර්ධනය, තරුණ හා කාන්තා හුවමාරුව මෙන්ම ජනතාව ජනතාව අතර සහසම්බන්ධතාවය අපේක්ෂා කරණු ලැබීමයි.

ඒ අනුව ජිංපිං ජනාධිපතිවරයා මහත් වූ සංකල්පයක් වන "එක් තීරයක් එක් මාවතක්" යන්නෙන් ලොවක් හමුවේ තබා ඇති මෙම ඉදිරි දැක්ම, මේ වන විට ප්‍රහල කතිකාවක් බවට පත්ව ඇති අතර, කවර තරාතිරමක රාජ්‍යකට වුවද ඉදිරි වසර කිහිපය තුළ අතිශය තීරණාත්මක වනු නොඅනුමානය.

*මාධවී රංගේබණ්ඩාර*
*මාධ්‍ය නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

## කර්තෘ මණ්ඩලය

*උපදේශනය*

ධම්මික දසනායක මහතා (පාර්ලිමේන්තු මහලේකම්)
කුෂාණි රෝහණධීර මහත්මිය (නියෝජ්‍ය මහලේකම් හා කාර්ය මණ්ඩලය ප්‍රධානී)
ටිකිරි කේ. ජයතිලක මහතා (සහකාර මහලේකම්)

*සංකල්පය හා මඟපෙන්වීම*

ශාන් විජේතුංග මහතා

*ප්‍රධාන සංස්කරණය*

බුද්ධිනි රාමනායක මෙනෙවිය
එදිරිවීර ගුණසේකර මහතා
නිම්මි හාතියල්දේණිය මහත්මිය

*ඡායාරූපකරණය*

නුවන් දුමින්ද මහතා

*පිටු සැලසුම්කරණය*

ඉෂාරා වික්‍රමසිංහ මෙනෙවිය

*අන්තර්ජාලය හරහා බෙදාහැරීම*

ඒ.පී.එම්.එම්.නුස්කි මහතා

# නිලධර වින්ති







**ජී. තච්චනාරාණි මෙනවිය**
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
පනත් කෙටුම්පත් කාර්යාංශය

බණ්ඩාරවෙල කුඩා කුසුම් උසස් බාලිකා විද්‍යාලයෙන් සහ බණ්ඩාරවෙල දෙමළ මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ ජී. තච්චනාරාණි මෙනෙවිය යාපනය විශ්වවිද්‍යාලයේ වාණිජවේදී උපාධිධාරිනියකි. එමෙන්ම විවෘත විශ්වවිද්‍යාලයේ නීති උපාධිධාරිනියක වන ඇය වෘත්තියෙන් නීතිඥවරියක ද වේ. මීට අමතරව කැලණිය විශ්වවිද්‍යාලයේ වාග් විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද හිමිය.

ජී. තච්චනාරාණි මෙනෙවියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක්ද, පාර්ලිමේන්තු ක්‍රමවේද පිළිබඳ ඩිප්ලෝමාවක්ද හිමිය.

පාර්ලිමේන්තු සාමාජිකත්ව අධ්‍යයන වැඩසටහනකටද ඇය එක්ව තිබීම විශේෂත්වයකි. ඉන්දියාවේ පාර්ලිමේන්තු අධ්‍යයන හා පුහුණු කාර්යාංශය සංවිධානය කළ ව්‍යවස්ථාදායක කෙටුම්පත් සැකසීමේ පුහුණු වැඩසටහනකද ඇය හැදෑරීම්හි නිරත වූවා ය.

වසර 1991 දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සම්බන්ධ වූ ජී. තච්චනාරාණි මෙනෙවිය මේ වන විට පනත් කෙටුම්පත් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂවරිය ලෙස කටයුතු කරමින් සිටින්නීය. ඇයගේ පාර්ලිමේන්තු සේවා කාලය වසර 30කට අධිකය.

**ශ්‍යාමා ප්‍රනාන්දු මහත්මිය**
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
මානව සම්පත් සංවර්ධන කාර්යාංශය

අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ ශ්‍යාමා ප්‍රනාන්දු මහත්මිය රුහුණු විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය හිමිකරගෙන තිබේ. විවෘත විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳ උපාධිධාරිනියක වන ඇය 2006 වසරේදී ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරියක ලෙස දිවුරුම් දුන්නාය.

1991 වසරේදී පාර්ලිමේන්තුවේ සේවයට එක්වන ශ්‍යාමා ප්‍රනාන්දු මහත්මිය පනත් කෙටුම්පත් කාර්යාංශය, අමාත්‍යාංශ උපදේශක කාරක සභා කාර්යාංශය (එවකට උපදේශක කාරක සභා කාර්යාංශය නම් වූ), මුදල් හා ගිණුම් කාර්යාංශය, මහජන පෙත්සම් කාරක සභා කාර්යාංශය, සැපයුම් හා සේවා කාර්යාංශය සහ මන්ත්‍රී සේවා කාර්යාංශය ඇතුළු අංශ රැසක සේවය කර තිබීම විශේෂත්වයකි.

ශ්‍යාමා ප්‍රනාන්දු මහත්මිය වර්තමානයේදී පාර්ලිමේන්තුවේ මානව සම්පත් සංවර්ධන කාර්යාංශයේ සහකාර අධ්‍යක්ෂවරිය ලෙස සේවය කරන්නීය. ඇයගේ පාර්ලිමේන්තු සේවා කාලය වසර 30කට අධිකය.

**නිශාන්ති සමරසිංහ වික්‍රමරත්න මහත්මිය**
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කාර්යාංශය

කොළඹ මියුසියස් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ නිශාන්ති සමරසිංහ වික්‍රමරත්න මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයේ වාණිජවේදී(විශේෂ) උපාධිධාරිනියකි.

1991 වසරේ මැයි මස 29 ඇනි දින පාර්ලිමේන්තුවේ සේවයට එක්වන ඇය උපදේශක කාරක සභාව, මුදල් හා ගිණුම් කාර්යාංශය, මන්ත්‍රී සේවා කාර්යාංශය, කාරක සභා කාර්යාංශය, සභා ලේඛන කාර්යාංශය, රජයේ ගිණුම් කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ආදි ඒකක රැසක සේවය කර තිබීම විශේෂත්වයකි.

වර්තමානයේදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කාර්යාංශයේ සහකාර අධ්‍යක්ෂවරිය ලෙස මෙන්ම එම කාරක සභාවේ ලේකම්වරිය ලෙසද ඇය කටයුතු කරන්නීය. ඇයගේ පාර්ලිමේන්තු සේවා කාලය වසර 30 කට ආසන්න වේ.

# ඡායා ගැලරිය

## නව වසරට සුභාශිර්වාද ලබාගනිමින්...







## කථානායකතුමා කොරියානු මිත්‍ර සබඳතා තර කරයි








## පූජ්‍ය අතුරලියේ රතන හිමියෝ පාර්ලිමේන්තුවේ දිවුරුම් දෙති








සන්නිවේදන දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100
ෆැක්ස් : +94 11 2777227

Parliament of Sri Lanka
@ParliamentLK
@slparliament
Parliament of Sri Lanka